# අනාගත තිරසාර සංවර්ධනයට අතීතයෙන් පාඩමක්

## ජන දැනුම, සියැටල් සහ පරිසරය

### ◆ හැඳින්වීම

මෙම සියවසේ වඩාත්ම සංවාදයට භාජනය වී ඇති, එසේම ඉදිරි සියවස් වලදී ද සංවාදයට භාජනය වේයැයි විශ්වාස කළහැකි අතිශය සිත් ආකර්ශනීය වූ ද පාරිසරික ලෙස වැදගත් වූද ලිපියක් දියුණු යැයි සම්මත රාජ්‍යයක රාජ්‍ය නායකයකු වෙත එම රාජ්‍යයේම නොදියුණු යැයි සම්මත ගෝත්‍රික නායකයෙකු විසින් 1854 දී එවා තිබුනි. මෙම අපූරු පුද්ගලයා එවකට රතු ඉන්දියානු ගෝත්‍රික නායක සියැටල් (Seattle) වන අතර, එම අපූරු හසුන්පත ලැබීමට තරම් භාග්‍යවන්ත වූ පුද්ගලයා එවකට ඇමරිකානු ජනාධිපතිවරයා වූ ෆ්‍රැන්ක්ලින් පියර්ස් (Franklin pierce) ය. මෙම ගනුදෙනුවට වස්තු විෂය වූයේ පරිසරය (environment) සහ ඇගයීමයි. (valuation) ජනාධිපතිවරයා විසින් ගෝත්‍රික නායකයාගෙන් ඔවුන් පරිහරණය කරමින් සිටි ඉඩම් මිලදී ගැනීමට යෝජනා කළ අවස්ථාවේදී පරිසරයේ ඇති මිල කළ නොහැකි අපූර්වත්වය හා සංකීර්ණ බව විස්තර කිරීමටත් පරිසරය ආරක්‍ෂා කිරීමේ වැදගත්කම හුවා දක්වීමටත් මොහු මේ ලියවිල්ල අවස්ථාවක් කරගෙන තිබුනි. මෙහි පහත සඳහන් කර ඇත්තේ එම ලියවිල්ලෙන් උපුටා ගන්නා ලද ජේද ඇතුලත් සංක්‍ෂිප්ත වාර්තාවකි.

"අපගේ පූජනීය වස්තුවක් වන මෙම භූමියේ ඇළ දෙළ දිගේ පළිඟු කැට මෙන් දිදුලමින් ගලා බස්නා ජලය නිකම්ම දිය දහරක් නොව අපේ මුතුන් මිත්තන්ගේ ජීව රුධිරයයි. මේ ගංගා අපගේ සොහොයුරන්ය. ඔවුහු අපේ පිපාසය සංසිඳුවති. අපේ ඔරු පාරු එහා මෙහා ගෙන යති. අපේ දරුවන් පෝෂණය කරති. මේ මහ පොළොව මිනිසාට අයත් නොවේ. ඒත් මිනිසා මහ පොළොවට අයිතිය. පවුලක සියළු දෙනාම එකම ලේ බැම්මෙන් බැඳෙන්නාක් මෙන් මෙලොව ඇති සියළු දෙයක්ම එකට බැඳී ඇත. ජීවිතය නැමති දල මිනිසා විසින් වියන ලද්දක් නොවේ. ඔහු එහි නූල් පටක් පමණි. එබැවින් මිනිසා එම දලට යමක් කරන්නේද එය ඔහුටම කරගන්නා උපද්‍රවයකි. අප සියළු දෙනා මිහිතලයේ - පරිසරයේ භාරකරුවන් පමණක් වන හෙයින් පරිසරය කෙලෙසීමට අපට වරම් නැත. පරිසරය අපේ මුතුන් මිත්තන් සුරක්‍ෂිතව අපට දයාද කොට දුන්නාසේම අපද එය අපේ අනාගත පරම්පරාවට සුරක්‍ෂිතව උරුම කොට දිය යුතුය." මීට වසර 150 කට පමණ පෙරදී සියැටල් විසින් ඉස්මතු කරන ලද ඇතැම් පාරිසරික මූලධර්ම (environmental principals) හා සංකල්ප (concepts) සාකච්ජා කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

### ◆ තිරසාර සංවර්ධනය

අද පවතින සම්පත් හෙට උපදින දරුවන්ගේ යහපත උදෙසා යොදගැනීමට හැකිවන පරිදි එකී සම්පත් ආරක්‍ෂා කරමින් වත්මන් ප්‍රජාවගේ යහපත උදසා ද ඒවා යොදගැනීම තිරසාර සංවර්ධනය ලෙස හඳුන්වනු ලබයි. මෙය ධරණීය සංවර්ධනය මෙන්ම ප්‍රවර්තනීය සංවර්ධනය (Sustainable Development) යනුවෙන් හඳුන්වනු ලබයි.


*(මිහිතල සමුළුව - 1992)*

***" අප සියළු දෙනාම මිහිතලයේ, පරිසරයේ භාරකරුවන් පමණක් වන හෙයින් පරිසරය කෙළෙසීමට අපට වරම් නැත. පරිසරය අපේ මුතුන් මිත්තන් සුරක්‍ෂිතව අපට දයාද කොට දුන්නා සේම අපද, අපේ අනාගත පරම්පරාවන්ට එය සුරක්‍ෂිත කොට උරුම කොට දිය යුතුය."***

"අප සියළු දෙනාම මිහිතලයේ පරිසරයේ භාරකරුවන් පමණක් වන හෙයින් පරිසරය කෙලෙසීමට අපට වරම් නැත. පරිසරය අපේ මුතුන් මිත්තන් සුරක්‍ෂිතව අපට දායාද කොට දුන්නා සේම අපද අපේ අනාගත පරම්පරාවන්ට එය සුරක්‍ෂිත කොට උරුමකොට දිය යුතුය.

*(සියැටල් 1854)*

මෙම සංකල්පයේ මූලික හරය වන්නේ අනාගත ප්‍රජාවන්ටද සිය අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමට හැකිවන පරිදි පරිසර සම්පත් (ස්වාභාවික හෝ නිර්මිත) ඉතා සැළකිල්ලෙන් පරිහරණය කළයුතු බවයි. 1992 පැවැති මිහිතල සමුළුවෙන් බිහිවූන මෙම සංකල්පයේ ද මීට වසර 150 කට පමණ පෙර නොදියුණු යැයි සම්මත රතු ඉන්දියානු ගෝත්‍රික නායකයා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් අදහසෙහිද කවර නම් වෙනසක් ඇද්ද? මට පෙනෙන එකම වෙනස වචන හරඹය පමණි. අරුතේ කිසිදු වෙනසක් නැත.



### ◆ පාරිසරික අගය තක්සේරු කිරීමට ඇති දුෂ්කරතාව

ආර්ථික විද්‍යාඥයින් විසින් පරිසරය සහ පරිසර සම්පත් වල අගය තක්සේරු (environmental valuation) කිරීමට නොයෙක් ක්‍රමෝපායයන් හඳුන්වා දී ඇත. එහෙත් පරිසරයට හෝ එහි ඇති සම්පත් වලට නියම මිළක් (real value) ලබාදීමට නොහැකි වී ඇත්තේ පරිසරය පිළිබඳව හෝ එහි ඇති සම්පත් පිළිබඳව හෝ පූර්ණ අවබෝධයක් අපට තවමත් ලැබී නැති හෙයිනි. අපේ සියළු අවශ්‍යතාවයන් අප සපයා ගනු ලබන්නේ පරිසරය විසින් නිපදවනු ලබන භාණ්ඩ (Goods) සහ සේවාවන් (Services) සෘජුව හෝ වක්‍රව භාවිතයට ගැනීමෙනි. එහෙත් පරිසරය පිළිබඳව අපේ දැනුම සීමිත හෙයින් පරිසරයට නියම මිළක් ලබාදිය හැකිද? අද අප නගන මේ ප්‍රශ්නයම සියටැල් විසින් ද 1854 දී එනම් මීට වසර 150 කට හා නිරවුල්ව පැහැදිලි කළ අපූරුව කොතරම් චමත්කාර ජනකද?



"පාරාදීසයක සුන්දරත්වය" - බුන්දල ලුණු ලේවාය.


පමණ පෙරදී අසා ඇත. ඒ මෙසේය. අහස, මහපොළවේ උණුසුම මිළට ගන්නේවත් විකුණන්නේවත් කොහොමද? වාතයේ තිබෙන නැවුම් බවත්, ජලයේ තිබෙන දිදුලන ගතියත් අපට අයිති දේ නොවේ. එහෙනම් ඒවා මිළට ගන්නේ කෙසේද? වාතයේ ඇති නැවුම් බවටත්, ජලයේ ඇති දිදුලන ගතියටත් මිළක් නියම කළ හැකිද? පරිසරයට සාධාරණ හා යුක්තිසහගත වටිනාකමක් ලබාදීමට ඇති දුෂ්කරතාවය එදා (1854 දී) සියැටල් ඉතා සරලව

### ◆ ස්වාභාවික සම්පත්

සෘජුව හෝ වක්‍රව මිනිසාගේ ප්‍රයෝජනයට ගතහැකි ස්වාභාවිකව ජනනය වන්නා වූ නොයෙක් දේවල් පරිසරයේ ඇති බව අද අපි පිලිගනිමු. මේවාට ස්වාභාවික සම්පත් (Natural resources) යැයි නම් කිරීමටද අපි පෙළඹී සිටිමු.

සියැටල් මුළු පරිසරයම සම්පතක් ලෙස හඳුනාගත් අපූරු මිනිසෙකි. ඒ බව ඔහුගේ ලිපියේ ඇතැම් වැකි වලින් අපූරුවට පැහැදිලි වේ. 'අපගේ පූජනීය වස්තුවක් වන මෙම භූමියේ ඇළ දෙළ දිගේ ගලා බසිනා ජලය නිකම්ම නිකම් දිය දහරක් නොව අපේ මුතුන් මිත්තන්ගේ ජීව රුධිරයයි. මේ ගංඟාවල් අපේ සොහොයුරන්ය. ඔවුන් අපේ පිපාසය සංසිඳුවති. අපේ ඔරු පාරු එහා මෙහා ගෙනයති. අපේ දරුවන් පෝෂණය කරති.'

'මේ මහ පොළවේ සෑම කොටසක්ම මාගේ ජනතාවට අති පාරිශුද්ධයි. දිලිසෙන හැම වැලි වෙරළක්ම, අන්ධකාර වනාන්තරයේ හැම මීදුම් පටලයක්ම රුං රුං ගාගෙන එන හැම මැසි මදුරුවෙක්ම සිහිපත් කරන්නේ අති පාරිශුද්ධ දේ හැටියටයි.' සියැටල් විසින් පරිසරයේ ඇති සෑම වස්තුවක්ම



පාරිශුද්ධත්වයට පත්කර ඇත්තේ ඒවා සිය ජීවිතයේ පැවැත්මට අත්‍යාවශ්‍ය සම්පතක් බව එද ඔහු ඉතා හොඳින් තේරුම්ගෙන සිටි හෙයිනි.

පරිසරයේ ජීවී (biotic) සහ අජීවී (abiotic) යැයි ප්‍රධාන සංඝටක දෙකක් ඇති අතර, ඒවායේ පැවැත්ම උදෙසා ඒවා අතර නිරන්තරයෙන් අන්තර් ක්‍රියා (Interactions) සිදුවන බව විද්‍යාත්මකව අද සනාථ කර ඇත. සියැටල් නම් වූ මේ අපූරු මිනිසාද පරිසරයේ ඇති මේ ලගන්නා සුළු බව සබඳතාවය මැනවින් තේරුම්ගෙන තිබුනි. පරිසරයේ ඇති මේ අපූරු සබැඳියාවට අපි අළුත් අර්ථකථනයක් ලබා දී ඇත්තෙමු. ඒ පරිසර පද්ධති සංකල්පයයි (ecosystem concept).

'අපි පොළවේම කොටසක් පොළව අපේම කොටසක්, සුවඳ කැවුන මල් අපේ සහෝදරියන්, මුවා, අශ්වයා, රාජාලියා, ඒත් අපේ සහෝදරයන්, ගල්කුළු, තණ බිමේ යුෂ, අශ්ව නාම්බගෙ ඇඟේ උණුසුම, මිනිසා, මේ කෝකත් අයිති වන්නේ එකම පවුලකටයි. අපේ මුත්තාට මුලින් හුස්ම දුන්නු සුළඟම තමයි උන්දගේ අන්තිම හුස්මත් බාරගත්තේ. සතුන් නැතිදට මිනිසාට මක්වේද? සතුන් ඔක්කොම මියගියදට මිනිසාත් ඉක්මනින් මැරිල යාවි පාළුව ඉවසගන්න බැරුව. ඇයි මේ හැම දෙයක්ම එකට සම්බන්ධ නිසයි මේ කොයිකත් අයිති වන්නේ එකම පවුලකටයි. පවුලක සියළු දෙනා එකම ලේ බැම්මෙන් බැඳෙන්නාක් මෙන් මෙලොව ඇති සියලූ දෙයක්ම එකට බැඳී ඇත. ජීවිතය නමැති දල මිනිසා විසින් වියන ලද්දක් නොවේ. ඔහු එහි නූල්පටක් පමණි. එබැවින් එම දලට යමක් කරන්නේද එය ඔහුටම කරගන්නා උපද්‍රවයකි. අද අපි කතාකරන පරිසර පද්ධති සංකල්පය (ecosystem concept) මෙයම නොවේද? මේ සැම දෙයක්ම එකට සම්බන්ධයි යනුවෙන් සියැටල් කියා ඇත්තේ අද අප කථාබහ කරන පරිසර සංඝටක අතර ඇතිවන අන්තර් සම්බන්ධතා (Interactions) නොවේ යැයි තර්ක කළ හැකිද? ආහාර දම (food chains) සහ ආහාර ජාල (food webs) පිළිබඳ සංකල්පයන් නොවේ යැයි තර්ක කළ හැකිද? අද අපට වස්තු විෂය වන්නා වූ පාරිසරික සමතුලිතතාවය මෙයම නොවේ යැයි කාට කිව හැකිද?

### ◆ පාරිසරික සමතුලිතතාවය

පරිසර විෂය පිළිබඳව සාකච්ජා කිරීමේදී නිතර සාකච්ජාවට භාජනය වන තවත් අපූරු සංකල්පයකි පාරිසරික සමතුලිතතාවය (environmental balance). පරිසරයේ ඇති ජීවීන් සහ අජීවීන් අතරද, ජීවීන් සහ ජීවීන් අතරද, අජීවීන් සහ අජීවීන් අතරද නිරන්තරයෙන් සිදුවන්නා වූ අන්තර් ක්‍රියා ඇත. පාරිසරික සමතුලිතතාවය පවත්වාගෙන යෑමේදී මෙය අතිශය වැදගත් වේ. පාරිසරික සමතුලිතතාවය බිඳවැටීමේ හේතුවෙන් නොයෙකුත් දුර්විපාක (reper cussions) වලට මුහුණ පෑමට සිදුවේ. උද: හරිතාගාර ආවරණය (green house effect) ලෝකය උණුසුම් වීම (global warming) දේශගුණික විපර්යාසය (climate change) යනාදිය පාරිසරික සමතුලිතතාවය බිඳවැටීමේ හේතුවෙන් අද අප අත්විඳින පරිසර ගැටළු කිහිපයකි.

සියැටල් ද මේ අපූරු දහම පිළිබඳව සිය ලිපියෙන් සාකච්ජා කර ඇත. ඒ සඳහා ඔහු යොදගෙන ඇත්තේ ඔහුටම අවේණික වූ වචන සමූහයකි. 'මීමුන් ඔක්කොම මරාදමල ඉවරවුනාම, වල් අශ්වයන් ඔක්කොම හීලෑකරල ඉවර වුනහම මහ වනන්තරේ සැඟවුන තැන් මිනිස් ගඳින් බරඋනහම, මෝරපු කඳුවල දර්ශනය, කතා කරන කම්බි පොටවලින් ඇවුරුනහම ඔබතුමන්ලාගේ ජීවිතය දීප්තිමත්ව බබලයි කියල හිතන්නේ කොහොමද?

'ගණ කැලෑවත් අද කෝ? රාජාලියන් කෝ? වේගයෙන් යන අශ්ව නාම්බන්ටත් දඩ කෙළියටත් ආයුබෝවන් කියනව කියන්නේ මොකක්ද? ජීවත්වන එකේ කෙළවරයි.' පාරිසරික සමතුලිතතාවය පිළිබඳවත් එය පවත්වාගෙන යෑමේ වැදගත්කමත් මොනතරම් අපූරුවට මේ ගෝත්‍රික මිනිසා විසින් විස්තර කර තිබේද?

### ◆ පරිසර දූෂණය

පරිසර දූෂණය (environmental pollution) අද ශ්‍රී ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම අවධානයට පාත්‍ර වී ඇති තවත් වැදගත් මාතෘකාවකි. ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය පිටුදැකීම සඳහා දනටමත් ජාතික ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ග හඳුන්වා දී ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමද දන් ආරම්භ කර ඇත. ගොඩබිම, ජලජ හා වායුම පරිසර අද දැඩිලෙස දූෂණය වෙමින් පවතී. මේ තත්ත්වය පිටුදැකීම සඳහා ලෝක ප්‍රජාවම ජාත්‍යන්තර සම්මුති සහ සන්ධාන තුළින් එකතු වී විවිධ සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොද ඇත. සියැටල් ද ඉතා පැහැදිලිව පරිසර දූෂණය මහ විපතක් බවත් එහි අවසානය ඉතා දුඃඛදායක බවත් පෙන්වා ඇත. ඒ මෙසේය.



'මහපොළොව දෙවියන් වහන්සේට බොහොම අනර්ඝයි. පොළවට හානි කිරීම ඒකේ මැවුම්කාරයන්ට හානි කිරීමක්. සුදු මිනිහාත් මැරියාවි. සමහරවිට අනිත් ගෝත්‍රවලට වඩා ඉක්මනින් තමුන්නාන්සේලාගේ ඇහේ කැත කුණු ගාගන්න ගියොත් කවදහරි දක තමුන්නාන්සේලාගේම කැතකුණු වලින් හුස්ම හිරවේවි.' කැතකුණු යනුවෙන් සියැටල් දක්වා ඇත්තේ විවිධ ස්වරූපයෙන් පරිසරයට එක්වන්නා වූ දූෂ්‍යකාරක (pollutants) වේ. සියැටල් මෙසේද කියා ඇත. 'අප මිහිතලයේ පරිසරයේ භාරකරුවන් පමණක් වන හෙයින් පරිසරය කෙළෙසීමට අපට වරම් නැත.' ඔහු පරිසරය කෙළෙසීම යනුවෙන් සඳහන් කර ඇත්තේ අද අපේ කථාබහට විෂය වී ඇති පරිසරය දූෂණය නොවේද?

## ◆ ප්‍රකෘතිවාදය සහ නියතිවාදය

මානව ඉතිහාසය පිළිබඳව සොයාබැලීමේදී පැහැදිලි යුග 03 කට බෙද දක්විය හැකිය. ඒ නියතිවාදය (negativism) සත්‍යවාදය (possibilities) සහ පරිසරය අභිබවා යෑම (Over ruling the environmental law) වේ. නියතිවාදී දහමට අනුව මිනිසා පරිසරයේම කොටසක් වන අතර, මිනිසාට පරිසරය ජයගැනීමේ හෝ එය වෙනස් කිරීමේ හැකියාවක් නැත. මේනිසා මේ මිනිසාට පරිසරයේ යම් යම් සීමා කිරීම් වලට යටත්ව ජීවත්වීමට සිදුවේ. සත්‍යවාදයට අනුව ඕනෑම පරිසරයක් මිනිසාට ජයගත හැකිය. ඔහු තම සිතැඟි අනුව තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට පරිසරය වෙනස් කිරීමට හැකියාවක් ඇති පුද්ගලයෙකි. රතු ඉන්දියානු ගෝත්‍රිකයින් සහ ඇමෙරිකානුවන් අතර මේ වෙනස සියැටල් පැහැදිලිව දුටුවේය. ඇමරිකානු මිනිසා පරිසරය සිය සිතැඟි අනුව වෙනස් කර ගන්නා අතරම පරිසරය අභිබවා යෑමේ අනතුරද එහි දුඃඛදායක අවසානයද තේරුම් ගැනීමට තරම් සියැටල් දුරදක්නා නුවණින් හෙබි පුද්ගලයෙකු විය. සියැටල්ගේ වචන වලින් එය මෙලෙස පැහැදිලි කරමු.

'අපේ ගති සිරිත් තමුන්නාන්සේලාගේ ගති සිරිත් වලට වඩා වෙනස්. තමුන්නාන්සේලාගේ නගර දක්කම රතු මිනිසුන්ගේ ඇස්වලට කඳුළු උනනවා. සුදු මිනිස්සුන්ගෙ නගරවල නිස්කලංක තැනක් නෑ. වසන්ත කාලේ ගස්වල කොළ දිග ඇරෙන සද්දෙට, පොඩි පොඩි සතුන්ගෙ සර සර සද්දෙට කන්දෙන්න තැනක් නෑ. ජලය මුමුනන කොට මට ඇහෙන්නෙ මහ අප්පොච්චිගෙ අප්පොච්චාගෙ කටහඬයි. ඒ මිනිසුන් මේ භූමියට ආදරේ කරන්නේ ලේ කැටි බිලිදෙකු අම්මගේ හදේ ගැස්මට ආදරේ කරන්නා වගේ. මේ මහපොළොව අපට නම් ශුද්ධ භූමියක්. ඒකෙ තියෙන්නෙ අපේ මුතුන් මිත්තන්ගේ අළු, පොළවට ගරු කරන්නට ඔබේ දරුවන්ටත් කියාදෙන්න ඕනෙ.'

මේ නියතිවාදී මිනිසාගේ නියම චින්තනය නොවේද? එහි ඔහු ඇමරිකානුවා දකින්නේ ඊට හාත්පසින්ම වෙනස් පුද්ගලයෙකු ලෙසිනි. 'අපේ ගති පැවතුම් සුදු මිනිසා නොදන්නා බව අපි දන්නවා. සුදු මිනිසා රාත්‍රියේ ඇවිත් තමන්ට ඕනෑදේ පොළවෙන් ලබාගන්නා වූ ආගන්තුකයෙක් නිසා, ඒ මිනිසාට කොයි භූමියත් එකයි. පොළව එයාගේ සහෝදරයෙක් නොවෙයි. සතුරෙක් එක් තැනක් ජයගත්තායින් පස්සේ තවත් තැනකට යනවා එයා යන්නේ එයාගේ මුතුන් මිත්තන්ගේ සොහොන් අතහැරල කිසිම කැක්කුමක් නැතුව. එයා එයාගේ දරුවන්ගෙන් මහපොළව පැහැරගෙන යනවා. එයා එයාගෙ මැණියන් වහන්සේ වන මහපොළවත් එයාගේ සහෝදරයා වන ආකාශයත් සලකන්නේ බැටළුවෝ වගේ නැතිනම් දිදුලන පබලු වගේ සල්ලිවලට ගන්නත් විකුණන්නත්, පැහැර ගන්නත් පුළුවන් දේවල් හැටියටයි. ඒ කෑදරකම මහපොළව ගිලගෙන කාන්තාරයක් ඉතිරි කරදෙයි.'

අද අපේ බොහෝ සංවාද වලට විෂය වන්නා වූ බොහෝ මාතෘකා සියැටල්ගේ හඬුන් පතෙහි ගැබ් වී තිබිනි. එහෙත් ඒවා ඇත්තේ අද අප භාවිතා කරන හරබර සංකල්ප ලෙස නොවේ. හුදෙක් මේ නොදියුණු ගෝත්‍රිකයාගේම බස් වහරෙකි. පරිසරයට මහත් ඇල්මක් දක් වූ පරිසරයේ ඇති බොහෝ ද මැනවින් තේරුම් ගත්, ඒ අනුව සිය ජීවිතය ගතකළ මේ උතුම් මිනිසා 1866 දී විශ්ව පරිසරයෙන්ම සමුගෙන ඇත.

සියැටල් මිය ගියත් පරිසරය පිළිබඳව ඔහුගේ මෙම අපූරු චින්තනය තව බොහෝ කාලයක් මිහිමත වෙසෙන්නාවූ බොහෝ මිනිසුන්ගේ නිරන්තර සංවාදයට මාතෘකා වනු ඇත.

**ඒ. ඒ. කුලතුංග**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)**

